## පියාණෙනි!

රෑ දාවල් දෙක නොබලන් නේ
මා හට හැම සුවසැප දෙන් නේ
මා හොඳ දරුවෙකු කරවන් නේ
පියාණනී ඔබ බුදුවන් නේ

මා ඉල්ලන දේ ගෙන දෙන් නේ
සුරතල් වදනින් සනසන් නේ
මට බෝනික්කෙක් ගෙනදුන් නේ
පියාණනී ඔබ බුදුවන් නේ

මා හඬනා කළ ලෙඩ සැදී
බෙහෙත් ගේන්නට එක්කගොසින්
බෙහෙත් පොවාලා නැලවූවා
පියාණෙනී ඔබ බුදුවේවා!

♦ **ඒ. ඒ. සගිකා දිල්රුක්ෂි**
**ගල්ලෑල්ල මහ විදුහල**
**රත්නපුර Sri Lanka**

## සමුගත් නැගණියට

සොහොන් බිම සිප හමන
සුළං රැල්ලට එතුණ
මට දැනෙයි නුඹෙ සුවඳ
දෙව්ලොවින් දෝ හමන

ටජ්මහල් සේ තැනූ
මහා සැමරුම් නැතත්
මම හැදූ මල් ගහේ
මල් පිපේ නුඹෙ නමින්

මිනීමල් සුවඳ මැද
පුංචි පැණි කුරුල්ලන්
ගී ගයති නුඹෙ නමින්
නුඹෙ තනිය මකන්නට

හිරු ද අවරට ගොසින්
සඳත් අහසට ඇවිත්
අර පුංචි තනිතරුව
නුඹවත් ද මට සිතෙයි

♦ **පූර්ණිමා ලියන්දෙනිය**
**මහමායා බාලිකා විදුහල**
**මහනුවර Sri Lanka**




## Who smoked the first cigarette?
## ප්‍රථම සිගරැට්ටුව ඉරුවේ කවුද?

The Aztecs smoked a hollow reed or cane tube stuffed with tobacco. Other natives in Mexico and parts of South America crushed tobacco leaves and rolled the shreds in maize husk. But it was the cigar, rather than the prototype of the cigarette, that the Spanish invaders brought from Mexico to Spain as a luxury for the wealthy.

Early in the 16th century beggars in Seville began to pick up discarded cigar butts and roll them in scraps of papers for smoking, thus improvising the first cigarette. By the 18th century they acquired respectability and their use spread to Italy, Portugal and later to France. During the Napoleon wars, French and British troops became familiar with them. The French named them cigarettes.

මැක්සිකෝවේ හා ලතින් ඇමරිකාවේ මිනිස්සු බටයකට දුම්කොළ ඔබා හෝ දුම්කොළ වියලි ඉරිඟු පොතුවල ඔතා හෝ දල්වා උරන්නට පුරුදුව සිටියහ. මැක්සිකෝව ආක්‍රමණයකළ ස්පාඤ්ඤ ජාතිකයන් එම සුරුට්ටු තම රටට ගෙන ගිය විට ඒවා සුඛොපොභෝගී භාණ්ඩ සේ සැලකිණ.16වන සියවසේ ස්පාඤ්ඤයේ හිඟන්නෝ පාරේ සුරුට්ටු කොට අහුලාගෙන එහි ඇති දුම්කොළ කොළයක ඔතා බීවෝය. ඒ සිගරැට්ටුවේ උපතයි. සිගරැට්ටුව යන නම තැබුවේ ප්‍රංශයින්ය. නැපෝලියන් යුද සමයේ ප්‍රංශ සහ බ්‍රිතාන්‍ය හමුදාවන්ට සිගරැට් නැතුවම බැරි විය.

♦ ***Auntie Ramani* (රමණී නැන්දා)**

## නුවර ඇසළ පෙරහැර



**ගි**ය අවුරුද්දේ වගේ මේ සැරෙත් අපි නුවර පෙරහැර බලන්න යනවා. නුවර ටවුමේ සඳමලී නැන්දලාගේ සාප්පුවේ උඩ සඳළු තලේ ඉඳලයි අපි පෙරහැර බලන්නෙ. එතනට හරි ලස්සනට පෙරහැර පේනවා. අලි ඇතුන් උඩරට නැටුම් දකින කොට බෙර හඬ ඇහෙන කොට අපට දැනෙන්නෙ හරිම සතුටක්. ගොඩාක් ටුවරිස්ලාත් පෙරහැර බලන්න එනවා. නුවර පෙරහැර අපේ ජාතික අබිමානයයි.

♦ ***නෙත්මි ත්‍රිමහවිතාන*** සමුද්‍රදේවි බාලිකා විදුහල නුගේගොඩ


BOC
ලංකා බැංකුව
BANK OF CEYLON
ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි
ලන්ඩන් ශාඛාව

වසර 57 කටත් වඩා කාලයක් පුරා ලන්ඩන් නගරයේ ඔබේ මුදල් අවශ්‍යතා සපුරාලමින් සේවය කරයි.

හෙට දවසේ සිහින සැබෑකරන
**NRFC** ගිණුමක් අරඹන්න !
උපයාගත් විදේශ මුදලට වැඩි වටිනාකමක් !

***ලංකා බැංකුව අනේවාසික ගිණුම් හිමියන් සඳහා නොමිළයේ ජීවිත රක්ෂණ ව්‍යාපෘතියක් යළි හඳුන්වා දෙයි.***

පවුම්, ඩොලර්, යූරෝ හෝ රුපියල් වලින් ඔබ ශ්‍රීලංකාවට මුදල් යවන විට අපේ සේවා භාවිතා කරන්න. එය ඉතා සුරක්ෂිතය, ලාභදායකය, කාර්යක්ෂමය.

ශ්‍රීලංකාව පුරා ලංකා බැංකු ශාඛා **301** කි. ඉන් **256** කම කටයුතු පරිගණක ජාලගතකර ඇත. ඕනෑම ශාඛාවකින් පවුලේ අයට හෝ නෑදෑ හිතවතුන්ට මුදල් යැවීමේ දී එය ගිණුම් වලට බැරකිරීමට හෝ ශාඛාවේදී මුදල් අතටම ලබාදීමට හෝ හැකි ය.

★ ***ආකර්ෂණීය විනිමය අනුපාතිකය.***
★ ***ඕනෑම වානිජ හෝ ඉතිරිකිරීමේ බැංකුවකට යැවිය හැක.***

ඔබගේම චෙක්පත් **කළමනාකරු, ලංකා බැංකුව, ලන්ඩන්** යනුවෙන් ලියා, ගිණුම් හිමියාගේ නම, ගිණුම් අංකය, බැංකුවේ නම හා ශාඛාව දක්වා තැපැල් මගින් අපට යොමුකරන්න. (බ්‍රිතාන්‍ය මූල්‍ය රෙගුලාසිවලට යටත්ව)
***වැඩි විස්තර සඳහා :***

**No 1, Devonshire Square, London EC2 M4WD**
**Phone : 020 7377 1888 Fax: 020 7377 5430**
**e-mail : bankofceylon.uk@btclick.com**
**Our Web - www.boc.lk**
**Nearest Railway Station - Liverpool Street ( tube & Rail ) Bishop Gate Exit**


# කලාකරුවෙක් - හිතවතෙක් අතිශය යහපත් මිනිසෙක් අකල්හි වියෝවිය



***රන්ජිත් පලන්සූරිය මහතා***

**පි**ටරට වෙසෙන කුඩා සිංහළ සමාජයක් වන අපට මෙහි ඇත්තේ ඉතා සීමාසහිත හිතවතුන් යහළුවන් සංඛ්‍යාවකි. ඒ අය අපේ පාසැල් මිතුරන් විය හැකි ය. නැතහොත් ශ්‍රීලංකාවේදී අප හොඳින් දැන හැඳින ආශ්‍රය කළ අය වන්නට පිළිවන. නැත්නම් අප සම්බන්ධව සිටි ක්ෂෙත්‍රයකට කිසියම් අයුරකින් සම්බන්ධව සිටි අය වන්නට හැකි ය. පසුගිය සතියේ ලන්ඩනයේ දී අභාවප්‍රාප්ත වූ රන්ජිත් පලන්සූරිය හිතවතාණන් එසේ මා ලංකාවේ දී දැන හැඳින ගත් ඉතා දුර්ලභ ගනයේ කළණ මිතුරෙකි. ඔහුගේ වියෝගය මට මෙන්ම ලන්ඩනයේත්, ශ්‍රීලංකාවේත් ඇසුරු කළ බොහෝ දෙනෙකු දැඩි ශෝකයට පත් කළ පුවතක් වීය.

පලන්සූරිය යන නම ඇසූ පමණින් කෙනෙකුගේ හිතට එන්නේ ශ්‍රීලංකාවේ සුප්‍රකට කවියෙකුව විසූ එමෙන්ම 1956 රජයේ ඇමතිවරයෙකුද වූ සාගර පලන්සූරිය හෙවත් කේයස් කවීන්ද්‍රයාණන්ය. රන්ජිත්, එම කිවිඳුන්ගේ බාල සොහොයුරු පියදාස පලන්සූරිය ලේඛකයාණන්ගේ එක් පුතණුවන් කෙනෙකි. කවියට සාහිත්‍යයට ලැදි පවුලක උපත ලැබීම නිසාම රන්ජිත්ගේ සිත ද සෞන්දර්යය කලාවන් වෙත සමීප වූ බවට සැක නැත.

දැන් මෙන් පරිගණක තාක්ෂණයක් නොතිබුණු ඒ අතීතයේ සිටම අසූවේ දශකයේ මුල හරිය වන තුරුම ශ්‍රීලංකාවේ පුවත් පත් සහ පොත් මුද්‍රණයේ දී පළකරන සෑම ඡායාරූපයක් හා චිත්‍රයක්ම මුද්‍රණ පිටුවට ගත්තේ බ්ලොක් (Block) නමින් හඳුන්වන ඊයම් තහඩුවක් මගිනි. ඒ බ්ලොක් කැපීම ඉතා වියදම අධික කාර්යයක් විය. එකල කොළඹ වූ ප්‍රධාන පෙළේ බ්ලොක් කපන සමාගමක් අයත් වූයේ පලන්සූරිය පවුලටය. 1970 දශකයේ මුල මා විසින් සංස්කරණය කරන ලද **දර්ශන** නම් සිනමා සඟරාව මුද්‍රණය කිරීමේ දී එසේ බ්ලොක් තනාගන්නට ගිය අවස්ථාවකදී මම මුලින්ම රන්ජිත් හඳුනාගත්තෙමි. ඒ යහළුකම ඔහු මිය යනතුරා එක් පරිදිම පැවතිණ.

රන්ජිත් තම පියාණන්ගේ නවකථාවක් වන **සිරිබෝ අයියා** චිත්‍රපටය නිශ්පාදනය කළේය. එහි අධ්‍යක්ෂක මහාචාර්ය සුනිල් ආරියරත්නයි. සිංහළ සිනමාවට එකතු වූ ඉතා සාර්ථක කෘතියක් වන සිරිබෝ අයියා ඒ වසරේ හොඳම චිත්‍රපටයද වෙමින් **සරසවි සම්මාන** හයක් ම දිනාගත්තේය.

**1985** දී රන්ජිත්ට වකුගඩු ආබාධයක් වැළඳින. ඒ නිසා වකුගඩුවක් බද්ධකිරීමේ අවශ්‍යතාව විය. ඒ වසරේ ලන්ඩනයට පැමිණි ඔහුට බටහිර ලන්ඩනයේ සුප්‍රකට **Royal Free** රෝහලේදී එම ශල්‍යකර්මය සිදුකරන ලදී. ඒ රෝගී තත්වය වරින්වර වෙනස්වන සුළු නිසා නිසි ප්‍රතිකාර ගැන්මේ වෛද්‍ය උපදේශ මත ඔහු ලන්ඩනයේම සිටීමේ අවශ්‍යතාව මතුවිය. ඒ අනුව රන්ජිත් තම බිරිඳ සහ දරුවන්ද සමග බටහිර ලන්ඩනයේ පියකරු පෙදෙසක වාසයට හුරුවිය.

ලන්ඩනයේ වෙසෙන නමුදු ඔහු හදවතින් මුළුමනින්ම ජීවත්වුණේ ලංකාවේය. තමා දන්නා හඳුනන සිනමා නාට්‍ය සංගීත හා සාහිත්‍ය ක්ෂෙත්‍රයන්හි කලාකරුවන් හිතවතුන් ගැන නිතර විමසමින් ඔවුනට දුරකථනයෙන් අමතමින් ඔවුන් ලන්ඩනයට පැමිණියේ නම් කෙසේ හෝ මුණගැසෙමින් දැක්වූ උනන්දුව අප දැක ඇත. එසේම දේශප්‍රේමියෙකු වූ හෙතෙමේ ශ්‍රීලංකාවේ දේශපාලන තත්වය ගැන දැඩි උනන්දුවකින් සිටියේය.

මෙම **ලංකාවිත්ති** පුවත් පතේ පාඨකයෙකු මෙන්ම එයට ලැදි සහෘදයෙකු ලෙසද ඔහු පත්‍රයේ සුබසිද්ධිය අවංකවම ප්‍රාර්ථනා කළේය. නිතර දුරකතනයෙන් මා ඇමතූ ඔහු පත්‍රයේ පළවන ලිපි, විශේෂාංග හා පද්‍ය ගැන කතා කළේ ඒ පිළිබඳ පැහැදීමෙනි. ලංකාවිත්ති අතට එනතුරා මගබලා සිටින වගද ඔහු නිතර මට කියා ඇත.

සියල්ල මධ්‍යස්ථ සිතින් ඉසිලූ ඔහු ඉතා කරුණාවන්ත මෙන්ම කෙනෙකුගේ හිත රිදෙන්නට වචනයක් හෝ කතා නොකරන, අනුන්ගේ වැරදි නොසොයන උදව් උපකාරයක් කරන්නට මැලි නොවන තමන්ගේ පාඩුවේ ජීවත්වූ කෙනෙකි. එවැනි අය සමාජයේ තවත් නැතැයි සිතෙන තරමට ගුණගරුක පුද්ගලයෙකු වූයේය.

තවත් එක් දෙයක් මෙහිදී මතක්කිරීම වැදගත්ය. එනම් ඔහු වැනිම වූ ඔහුගේ පවුලේ අය ගැනය. රන්ජිත්ගේ ආදරණීය බිරිඳ නාලිනී සුප්‍රකට කොළඹ යුගයේ කවියෙකු වූ විල්සන් හැගොඩ මහතාගේ දියණියකි. ඇය ඉතා කරුණාවන්තය. සිය සැමියාගේ සියළු කටයුතු නොපිරිහෙළා ඉටු වූයේ ඈ අතිනි. රන්ජිත් හා නාලිනී එකිනෙකා කෙරෙහි සෙනෙහෙන් බැඳුණු පෙම්වත් යුවලක් වූහ. ඔවුන්ගේ දියණියන් දෙදෙන හා පුතා ද විනීතව හැදුණු වැඩුණු දෙමාපියන්ට ඉතා කීකරු ශිෂ්ට සම්පන්න දරුවෝ වෙති. එසේම ඒ පවුලට එක්වූ බෑනාවරුන් දෙදෙනද ඒ හා සමානය. හැම අතින්ම යහපත් එවැනි පවුලක් මේ වර්තමාන සමාජයේ අපට හමුවන්නේ ඉතා කලාතුරකිනි.

රන්ජිත් මිය යන විට ඔහුගේ වයස හැට හතරකි. ඔහු තව බොහෝ කලක් ජීවත්විය යුතු කෙනෙකි. එහෙත් ලෙඩ රෝග එයට ඉඩ නොදුන්නේය. ඔහු අසනීපව රෝහල් ගතවූ බව ඇසූ විට මා පුදුම වූයේ ඊට සතියකට පමණ පෙර මා ඔහුට දුරකථනයෙන් කතා කළ නිසාය. එදින ද බොහෝ වේලාවක් සුපුරුදු ලෙස ලංකාවේ තොරතුරු හා අප දන්නා කලා ලෝකයේ හිතවතුන් ගැනද අපි දෙඩුවෙමු.

කෙනෙකු වසර සීයක් ජීවත් විය හැකිය. තවත් කෙනෙකු ඊට වඩා අඩු අවුරුදු ගණනක් ජීවත් විය හැකියි. එහෙත් ජීවිතයක අගය මැනෙන්නේ ජීවත්ව සිටි අවුරුදු ගණන අනුව නොව ඒ සිටි කාලය තුළ කොතරම් යහපත්ව, ගුණගරුකව, සමාජයට හිතකරව ජීවත් වූවා ද යන්න මතය. ඒ නයින් රන්ජිත් පලන්සූරිය හිතවතාණන්ගේ දිවිය හැම අතින්ම සම්පූර්ණ කිසිවෙකුට දොසක් කිව නොහැකි ජීවිතයකි.

මේ සටහන මා ලියන්නේ මා මෙන්ම ඔබට ලැදි තවත් හිතවතුන් රැසක් වෙනුවෙනි. ඔබගේ හදිසි අභාවය ගැන අපි දැඩිසේ දුක්වෙමු. ඔබ වැනි හිතවතෙකුගේ එක වචනයක් වුවද අපේ සිතට මහත් සහනයකි. ඔබ වැනි අය අපට හැමතැනම හමුනොවේ. හිතාදර රන්ජිත්, මේ සසර ගමනේ ඔබ අපට යළිත් හමුවේවායි පතමු.

♦ ***දයා ආනන්ද***


***Srilanka Information Site ශ්‍රී ලංකා තොරතුරු අඩවිය***
**www.srilankans.com**